මෑත කාලය තුළ බාලවයස් ලිංගික අපයෝජනයන් පිළිබඳ බොහෝ පුවත් වාර්තා දක්නට ලැබුණු අතර, ඒ පුවත් වාර්තා අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක මෙම බාලවයස් ලිංගික අපයෝජනයන් වඩාත් සැහැල්ලු කොට දැක්වී තිබූ බවද අපට නිරීක්ෂණය කරන්නට හැකි විණි.

එම ප්‍රවණතාවයට තවත් උදාහරණයක් ලෙසින් දිවයින පුවත්පතේ (08/20) "මාමාගේ නිවසට පෙම්වතා ගෙන්වා ගත් දැරියට වැඩ වැරදිලා" යන සිරස්තලයෙන් යුතුව දැක්වුණු පුවත් වාර්තාව පෙන්වාදිය හැක. එම පුවත් අන්තර්ගතයේ බාලවයස්කාර දැරිය ලිංගික අපරාධයකට ලක්වූ බව සඳහන් වන අතර, ඇය විසින් සිය පෙම්වතාව දුරකතන ඇමතුමක් ලබාදී මාමාගේ නිවසට ගෙන්වාගෙන ඇති බවද වැඩිදුරටත් සඳහන් වේ.

බාලවයස්කාර අයෙකු හා ඔවුන්ගේ කැමැත්තෙන් වුවත් ලිංගික සබඳතාවයක් පැවැත්වීම නීතිය ඉදිරියේ වරදක් ලෙසින් සැලකේ. එය "ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයක්" ලෙසින් දැක්වේ. එසේ නම්, වින්දිතයාට වරද පටවන සුළු ඉහත ආකාරයේ සිරස්තලයක් යොදාගැනීම කෙතරම් යෝග්‍යදැයි අපට ඇසීමට සිදුවේ. එසේම, නීතිය ඉදිරියේ දඬුවම් ලැබිය හැකි වරදක් වන බාලවයස්කාර ලිංගික අපරාධයක් මෙසේ "වැඩ වැරදීමකට" ලඝු කිරීම ඔස්සේ, එවැනි අපරාධ වඩාත් සාමාන්‍යකරණය වීමක් සිදු නොවන්නේද?

එසේම දූෂණය යන යෙදුම ඔස්සේ වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් හැඟවෙන බැවින්, ලිංගික අපරාධය/ලිංගික අපයෝජනය වැනි යෙදුම් වඩාත් යෝග්‍ය වේ.

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina**